## අවසන් කොටි නැටුම 1 වන පිටුවෙන්

ඝාතනය කිරීමට මූලිකව කටයුතු කළ තමන් උපන් රට කෙළෙසන මහා කාලකණ්ණි පිරිසකි.

### ගජබින්න න්‍යාය Theory of the Big Lie

දෙවන ලෝක යුද සමයේ හිට්ලර්ගේ නාසිවාදයේ ප්‍රධානම ප්‍රචාරකයා වූයේ ගොබෙල්ස්ය ( Goebbels ) ඒ යුගයේ දක්ෂතම ප්‍රචාරකයා ලෙස ගැනුණු මොහුගේ න්‍යාය ගජබින්න න්‍යාය වශයෙන් හැඳින්වෙයි. එහි අදහස වූයේ බොරුව ලොකුවූ පමණට සහ එය පුන පුනා ප්‍රචාරයවූ පමණට අනුපාතිකව එය ජනතාව විසින් විශ්වාසකරනු ලබන බවයි. මේ න්‍යාය මත ජර්මන් ජනතාව මුලාකොට **මහජාති** වාදයක් මත පිහිටා අහිංසක යුදෙව් ජාතිකයන් මිලියන ගණනක් ඝාතනය කළ ආකාරයද අවසානයේ දෙවන ලෝක යුද්ධයෙන් පරාජය වෙත්ම හිට්ලර් හා ගොබෙල්ස් දිවිනසාගත් ආකාරයද මෑත ලෝක ඉතිහාසයේ දැක්වෙයි.

### කොටි ව්‍යාපාර ගජබින්නය

ප්‍රභාකරන් කොටි ව්‍යාපාරය ආරම්භ කළේද, දිගටම පවත්වාගෙන ගියේද මෙම ගජබින්න න්‍යාය මත පිහිටාය. හැම නිහීන වැඩක්ම කරමින් රැස්කරගත් මුදල් මගින් ටැමිල්නෙට් එකෙන් ආරම්භ කොට ලෝකයේ හැම ගැති මාධ්‍යයකටම රිංගමින් කොටි බලය පුම්බා දක්වනු ලැබිණි. අප රටේද බටහිර ගැති මාධ්‍යකාරයින්ද, **NGO, INGO** කාරයින්ද මේවාට ගැතිව අවනතව මේ බොරුව පිම්බූහ. දැන් වෙනතුරුම බොහෝ අයගේ අදහස වූයේ කොටින් කවදාවත් පරාජය කළ නොහැකිය යන්නයි. මේ ඒ ගජබින්න මත පිහිටාය.

පිටරට කෙසේ වෙතත් අප රටේ පවා ඇතැම් දේශපාලකයින් මේ බව කීවා අපට මතකය. සමසමාජ පක්ෂයේ වික්‍රමබාහු කරුණාරත්නලා, සාමපෙරමුණේ ජෙහාන් පෙරේරලා, කුමාර් රූපසිංහලා පමණක් නොව විපක්ෂනායකයා පවා ප්‍රකාශ කළේ කිසිදින ශ්‍රීලංකා හමුදාවට කොටි පරාජය කළ නොහැකි බවයි. ගාල්ලේ වජිර අබේවර්ධන කොටි පරාජය කළහොත් තමා ආගම පවා අත්හරින බවට කියා තිබුණි. මේ සියළු දෙනා කොටින්ගේ ගජබින්න පිළිගෙන ඒ අනුව තම චින්තනය සාදාගෙන සිටින අයයි. තවමත් එසේ සිතනවාදැයි කවුරු හෝ ඔවුන්ගෙන් ඇසිය යුතුය. ඒ පුම්බා තබන ලද කොටි ව්‍යාපාරය හා කොටි දක්ෂතා හිටිවනම හුළං ගිය බැලුමක් මෙන් ඇකිලී වැටෙනු දැක්ම දරාගත නොහැකි කොටි ඩයස්පෝරාවේ උන් දැන් සිහි විකල්වූවන්සේ දඟළති.

### කොටි බලය ගරා වැටීම

අප හමුදා ඉතා උපක්‍රමශීලීව සහ ප්‍රබලව ගෙනගිය සටන් නිසා කොටි බලය සීඝ්‍රයෙන් කඩාවැටිණි. මුලදී උපක්‍රමශීලී පසුබැසීම් **(tactical withdrawal)** යනුවෙන් හඳුන්වමින් උන් විසින් දක්වනු ලැබූ මේ පසුබැසීම් වඩාත් වේගයෙන් සිදුවන්නට විය. ක්‍රමයෙන් මන්නාරම සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක වලින් පන්නා දමනු ලැබ උන් මුලතිව් වලද අග කොණට අද කොටුවී ඇත. වෙනම භූමි භාගයක්ද, ත්‍රිවිධහමුදාවක්ද, ඔවුන්ගේම පොලීසියක්, අධිකරණ යක්, බැංකුවක් සහ රූපවාහිණී පහසුකම් යුත් ජනමාධ්‍ය ආයත නයක් ආදියෙන් සමන්විතව ගොඩනගාගෙන ඇති ලෝකයේ **එකම බලසම්පන්න කැරලිකාර කණ්ඩායම** යනුවෙන් ලොව පුරා මාධ්‍යකරුවන් විසින්ද ප්‍රචාරය කරනු ලැබූ මෙම **ඊළාම් ගජබින්නය** අද සම්පූර්ණ පුස්සක් බවට සකල ලෝකයා හමුවේම පත්වීම ලැජ්ජාවක් ඇත්නම් දෙමළ ඩයසපෝරාවට මුහුණ සහවාගන්නට බැරි කරුණයක් වී තිබේ.

### ජනතාව ප්‍රාණ ඇපකරුවන් කරගැනීම

කොටි ක්‍රමයෙන් පසුබසිත්ම එම ප්‍රදේශවල ජනතාව යුද්ධයට කොටු නොවී දහස් ගණනින් පණ බේරාගෙන රජයේ පාලන ප්‍රදේශවලට පැන ගත්හ. අන්තිමේ මුලතිව්වලද ක්‍රමයෙන් කුඩා වෙමින් ගිය කොටි බල ප්‍රදේශයට ජනතාව කොටුවෙනවාත් සමගම කොටි ඒ ජනතාවට පිටවී යා නොදී තුවක්කුව එල්ලකොට ඉදිරියට තල්ලු කරමින් උන්ගේ ප්‍රාණ ඇපකරුවන් ලෙස ගෙන ඒ ජනතාව මිනිස් පළිහක් බවට පත්කර ගත්හ. කවදත් කළා සේ මෙතනදීත් මුන් කර ඇත්තේ තම ජීවත්වීම සඳහා ජනතාව උපයෝගී කරගැන්මය. පණ බේරාගෙන පැන ආ අය කියන පරිදි එසේ පැන යන්නට තැත් කරන අය කොටි විසින් නිර්දය ලෙස වෙඩිතබා මරා දමනු ලබයි. බලය වඩ වඩා පිරිහෙනු සමගම ඔවුන් වඩ වඩා නිර්දය වුවද දැන් දැන් දහස් ගණනින් ජනතාවද පණ ගලවාගෙන පැන එති.

මේ සමග මුන්ගේ ගජබින්න ප්‍රචාරද වඩ වඩා තීව්‍රවී ඇත. එසේම ඒ සඳහා මෙහි දෙමළ ඩයස්පෝරාවද මහා පරිමාණයෙන් ක්‍රියාත්මකව ඇත. බටහිර මාධ්‍යයද සුපුරුදු පරිදි මේවාට රුකුල් දෙති.

### යුද්ධයට මැදිවූ අසරණයින් පිරිසක්
### ( Victims of War )

කොටුවී ඇති කොටිරැළ මේ පිරිස ප්‍රාණ ඇපකරුවන් කරගන්නවා සමගම කොටි ඩයස්පෝරාවේ ප්‍රචාරයද යුද්ධයට මැදිවූ අසරණ යින්ගේ දුක්ඛිත තත්වය හුවා දක්වමින් වෙනස් විය. මාස ගණනකට පෙර ඔවුන් විසින්ම ගණන් තබන ලද 1,50,000 - 200,000 දක්වා සිටිනවාය කියූ මේ පිරිස් සංඛ්‍යාව දැන් 250000 වශයෙන් උන්ම ප්‍රචාරය කරති. දිනපතා දහස් ගණනින් දෙමළ සිවිල් වැසියන් පැන එද්දීත් සංඛ්‍යාව එන්න එන්න වැඩිවෙන්නේ කෙසේදැයි කිසිවෙක් නාසති. මෙහි මාධ්‍යකරුවෝද මේ ගණන් දක්වති. ශ්‍රීලංකා ආණ්ඩුව ගෙන යන කුරිරු යුද්ධයකට මැදිවූ මේ අසරණයින් පිරිස ගැන ගජබින්න ප්‍රචාරය කරති. මේ අයගේ පණබේරාගැනීමට සටන් විරාම ඉල්ලති. සරල වශයෙන් යුද්ධයකට දෙපාර්ශ්වයක් වත් තිබිය යුතුය. ඒ අනික් පාර්ශ්වය දරුණු ත්‍රස්තවාදීන් රැළක් බවත් ඔවුන් ඒ ජනතාව ප්‍රාණ ඇපකරුවන් ලෙස රඳවා ගෙන සිටින බවත් මුන්ගේ කළබැගෑනිය වසන්කරයි. ඩයස්පෝරා සහ බටහිර මාධ්‍ය ප්‍රචාරවල නියම අරමුණ මේ අසරණයින් මුදාගැනීම නොව උන්ගේ මිතුරන් වන ප්‍රභාකරන් ප්‍රමුඛ කොටි ත්‍රස්තයින් මුදාගැනීම බව ඉතා පැහැදිලිය.

# ට්‍රෝජන් අස්පයෙක්
# A Trojan horse

The Tamil Tiger terrorists are back at their usual ploys again! Since about a couple of weeks these " angels of mercy" seem to have landed in areas of London where Tamil tiger organisers have been usually haunting for years.This time it is for a **" mercy mission to the Vanni"** to take food, medical supplies etc. to supposedly suffering people internally displaced by the war.These are planned to be taken by a ship named **VANANGA MAN**. Is it one of the Tiger ships still remaining afloat ?

Suddenly a number of organisations calling themselves Tamil Charities with names carrying varous acronyms as usual have started distributing leaflets and putting half page advertisements in some local papers asking for food, medical supplies and money for this purpose. We know how adept the Tigers have been at conjuring such organisations out of thin air - and we are also aware of how and what some such organisations like the infamous **TRO** did with the millions collected for the Tsunami a few years back !

All this is for the victims of a "disaster" that has struck the people in an area called Vanni in northern Sri Lanka and to take this by this specially chartered " mercy ship " to this area called "Eelaam" (as shown in a map in the paper advertisement) which today exists only in the deranged brains of these Tiger Terrorists and their idiotic supporters!




**Vananga Man -LTTE Ship**
**වනංගාමන් - කොටි නැව**


In this situation when the Sri Lanka government is at the final stages of wiping out this scourge of Tamil Tiger Terrorism, one is tempted to ask, " Is this a Trojan Horse? " The term **Trojan Horse** refers to any trick or a ploy that causes a target to invite a foe into a securely protected bastion or a place.

Since the time Tiger Terrorist leaders including Prabhakaran, his son and close allies have been progressively trapped into a small slice of land a few square kilometres in area, the Tiger propaganda by the diaspora and their big lie machines have been intensified on all possible fronts.

So it is very clear what the real concern of these "angels of mercy" is. It is not the thousands of these hapless civilians but the saving of these most vicious group of terrorists by whatever means."These Angels" of Mercy are the fellows who never even bothered to send even a tablet of **Disprin** to the people of **Vanni** all these years ! If they really care for them, even now they can send all these medical help to the hospital recently established in northern Sri Lanka by India and is doing a yeomen service for all these people.(We suggest this in case these angels do not trust the Sri Lankan Government).The reality is that all these years the people of Vanni have been regularly fed, provided hospitals, medicines and health care by the Sri Lankan Government. This is continuing even now in the midst of fighting. The Tigers are known to be plundering these supplies mercilessly to feed their terror army !

These being the facts and the situation we have all the deepens suspicions of what this "Trojan Horse" of a "mercy mission" is:

**A.** Firstly this seems to be a Tiger ship chartered and equipped here. Who knows



**The legendary Trojan Horse**
**දැවයෙන් නිම කළ ට්‍රෝජන් අශ්වයා**

what it is equipped with though pretending to be taking medical supplies. Knowing the Tigers one can imagine what these terrorists are upto. Having seen from the equipment and 'factories' these terrorists had abandoned when they fled, we know how well they had been supported by infamous INGOs and others like Norway for these crafty activity especially in the sea and sub-marine wise. So it is a danger even to let them come close to our waters.

**B.** This may be a ruse to distract attention when the tigers are fast reaching their end. May be to throw a lifeline to the tiger leaders to escape in the confusion. It may really be a "Mercy Mission" for the Tiger Leaders! How come the Tigers have asked again for a cease - fire exactly at this juncture?

It is perfectly correct for our Government to have taken the stand to refuse to heed to any of these outright and take steps to wipe out this scourge for good.

We are confident that the Government of Sri Lanka would know how to handle this situation according to international law. After all it is responsible for the safety and well being of over twenty million of our people of all ethnic groups living in our country.

ලන්ඩනයේ වෙසෙන දෙමළ අයගෙන් ආධාර එකතුකර කොටි සපෝටර්ලා ලන්ඩනයේ සිට වන්නියේ අතරමංව සිටින ජනතාවට කෑම බීම, බෙහෙත් ඇඳුම් ආදිය යවනවාය කියා නැවක් ලංකාවට ගිය සතියේ පිටත්කර යැවීය. එය සානුකම්පික මෙහෙවරක් බව ඔව්හු කියති. එහෙත් නැව ඇතුළේ මොනවාදැයි කිසිවෙක් නොදනිති. ඒ බඩු අතරේ දැන් පණ අදින කොටින්ට ආයුධද තිබෙන්නට බැරි නැත. ඒ යවන බඩු සෝදිසිකර බලන්නට ලංකා රජයට ඉඩ දෙන්නේ නැතැයිද කොටි සපෝටර්ලා කියා ඇත. මීට පෙර කොටින්ට වන්නියටම ආයුධ හා අවශ්‍ය සියළු දේ යැවූ ලස්සන මෙවරද මොවුන්ට මතක්වන්නට ඇත.

මේ කිසිවක් ගැන කලබල නොවන ශ්‍රීලංකා ආරක්ෂක අමාත්‍යංශය කියන්නේ ලංකාවට අයත් මුහුදු ජල සීමාවට ඇතුළුවන ඕනෑම පිටස්තර යාත්‍රාවක් සඳහා ගතයුතු සුදුසු පියවර ශ්‍රීලංකා නාවික හමුදාව ගන්නවා ඇත යන්නයි. ඒ පිළිතුර අපට හොඳටම ප්‍රමාණවත්ය.

♦ **Wakula Gunapala -** Ilford **Essex UK**

### ඩයස්පෝරාවේ විවිධාකාර නැටුම් ප්‍රචාරක රැලි සහ උද්ඝෝෂණ

මේවා දැන් මාස ගණනාවක් කැනඩාවේද යුරෝප්පයේද එක්සත්ජනපදයේ හා තමිල්නාඩුවේද මේ ප්‍රශ්නය අරභයා විවිධාකාරයෙන් පැවතිණ. මේවායේ ප්‍රධාන අරමුණ වූයේ එම රටවල රජය ලවා අප රටට බලපෑම් කරවීමය. මුන්ගේ ව්‍යාපාරය බ්‍රිතාන්‍යයේ තහනම් ව්‍යාපාරයක් වුවද මෙහි උන්ගේ ඡන්දයෙන් යැපෙන දේශපාලන බංකොලොත්භාවය ලද මන්ත්‍රීන්ගේ බලපෑම උඩ මෙහි අගමැති බ්‍රවුන් බලෙන් අප රටට නියෝජිතයෙකු ඒක පාර්ශ්විකව යවන්නට තැත් කළ විට ශ්‍රීලංකා රජයගත් නිවැරදි ස්ථාවරය අපි දුටුවෙමු. මුන්ගේ රැළිවලින් පෙනෙන්නේ මේ ඩයස්පෝරාව අප රට සමග ගොඩනගාගෙන ඇති වෛරයේ තරමය. මුන්ගෙන් කීප දෙදෙනෙකු දිවිනසාගැනීමද මේ කොටි නැටුම්වල ඛේදජනක පැත්තක්ද පෙන්වීය.

### අන්තර්ජාතික ආයතනවලට බලපෑම් කිරීම සහ ඒවා ව්‍යවර්ථවීම

**A.** ඩයස්පෝරාවේ තව කොටසක් මේ උන් කියන මානව ප්‍රශ්නය ඉදිරියට දමා ලංකාණ්ඩුවට බලපෑම්කර යුද්ධය නතරකරවා උන්ගේ ත්‍රස්ත නායකයින් බේරාගැනීමේ ප්‍රයත්න කළහ. මේ සඳහා කොටි ඩයස්පෝරාවේ අය විවිධ පෙරටු සංවිධාන සාදාගෙන යුරෝපා සමුළුව සහ එක්සත් ජාතීන්ගේ මානව අංශවලට දුක්ගැනවිලි ඉදිරිපත් කළහ. මුන් මොනවා කීවදළුම වගකිව යුතු ආයතන ඒ සඳහා සුදුසු බලධාරීන් ලංකාවටද එහි යුද පවතින ප්‍රදේශවලටද රජයේ අනුමැතිය ඇතිව යවා විමසා බැලූහ. ඒ ආයතන දෙකෙන්ම දෙනු ලැබූ තීන්දුව නම් එල්ටීටීඊය ප්‍රාණ ඇපයට ගෙන රඳවාගෙන සිටින පිරිස් වහා නිදහස් කළ යුතුය යන්නයි. ආයුධ බිම තබා සටන්විරාමයකට ආ යුතුය යන්නයි. ලංකා රජයද මුල සිටම කීවේ මෙයයි.

**B.** මෙයට පසු මුන් බැලුවේ ලංකාව තිබෙන්නේ කොහේදැයි කියාවත් නොදන්නා මෙක්සිකෝව, ඔස්ට්‍රියාව සහ ආර්ජන්ටිනාව යන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල සාමාජික රටවල් තුනක් අල්ලාගෙන ලංකාවේ මේ මානව ප්‍රශ්නය එම මණ්ඩලයේ සාකච්චාව සඳහා න්‍යාය පත්‍රයට ගැනීමට උත්සාහ කිරීමටය. මෙය රටක් අභ්‍යන්තරයේ රජයක් විසින් කරනු ලබන කාර්‍යයක් බැවින්ද මෙය එවැනි ආයතනයක සාකච්ඡාවට බඳුන්වීමට තරම් දෙයක් නොවේයයිද රුසියාව සහ චීනය තරයේම කියා සිටියහ. වීටෝ බලය ඇති මේ රටවල් ගත් ස්ථාවරය මත එම උත්සාහය ප්‍රතික්ෂේප වීය.

**C.** එයට පසු දැනට සති කීපයකට පෙර එක්සත් ජාතීන්ගේ ජජෙනීවාහි මානව අයිතිවාසිකම් අංශයේ ලොක්කියයි හඳුන්වාගත් නවනීතන් පිල්ලේ නොහොත් නවි පිල්ලේ නමැති දෙමළ ගැහැනියක් මුන් වෙනුවෙන් ඉදිරිපත් වූවාය. කොටි ඒජන්ත ප්‍රචාරයෙන්ම අහුලාගත් සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරමින් ශ්‍රීලංකා රජය දහස් ගණනින් අසරණයින් මරණ බව හා තුවාලකරන බවට ඇය ලොකු ප්‍රචාරයක් කළාය. මේවා කොටි දෙන සංඛ්‍යා ලේඛන අනුව කළ දෙයක් බව ඔප්පුවීමත් සමග ඇය දැන් පසුබැස සිටී. මේද කොටි ධෙනුවක් බවට ලොකු සැකයක් ඇත. මේ ප්‍රයත්න සියල්ල කඩාවැටී මෙන් පසු දෙමළ ඩයස්පෝරාව තව තව නැටුම් දක්වනු නොඅනුමානය. මෙහි පසෙක දක්වන ආකාරයට දැන් බ්‍රිතාන්‍යයේ සිට පිටත්කර යවා ඇති **සානුකම්පික මෙහෙවර ( Mercy Mission)** නැව අළුත්ම නැටුම ය.

එහෙත් දැන් පෙරහැර අවසාන වන්නට ඉතා කිට්ටු බැවින් දැන් පාන නැටුම් බලන්නට කෙනෙක් නැතුව යනවා නියත ය.